**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක අමාත්‍යංශය**

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත**
**ලැප්ටොප් පරිගණක 50 සපයා, ගෙනැවිත් භාරදී,**
**ස්ථාපනය කොට, නඩත්තු කිරීම සඳහා වන ප්‍රසම්පාදනයයි**

## IFB NO : DIE/PRO/04/2023/56

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැප්ටොප් පරිගණක 50 සපයා ගෙනැවිත් භාරදී ස්ථාපනය කොට නඩත්තු කිරීම සඳහා මුද්‍රා, තැබූ ලංසු යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මෙමගින් කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

3. අභිලාෂී ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 5 වන මහල "සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර බත්තරමුල්ල යන ලිපිනයට 2023.10.27 වන දින සිට 2023.11.16 වන දින දක්වා රාජකාරී දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා යොමු කිරීමෙන් හා ආපසු නොගෙවන ශ්‍රී ලංකා රුපියල් අට දහසක (ශ්‍රී ලංකා රු. 8,000.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ලබාගත හැක. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.

4. අභිලාෂී ලංසුකරුවන්හට මේ පිළිබඳ වැඩිමනත් විස්තර දුරකථන අංක 0112101559 ඔස්සේ රාජකාරී දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැක. ලංසු ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කිරීම 2023.10.27 වන දින සිට 2023.11.16 වන දින දක්වා 3 වන ඡේදයේ සඳහන් ස්ථානයේදී මෙන්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන (**www.immigration.gov.lk**) වෙත පිවිසීමෙන්ද සිදුකළ හැක.

5. යථා පරිදි සම්පූර්ණ කරන ලද ලංසු "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" වශයෙන් පිටපත් දෙකකින් යුක්තව වෙන වෙනම කවරවල බහා පසුව එම කවර එක් කවරයක බහා එහි වම්පස උඩු කෙළවරෙහි කොන්ත්‍රාත්තුවේ නාමය හා IFB අංකය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් 2023.11.17 වන දින ප.ව. 2.00 හෝ ඊට පෙර ලැබෙන ලෙස එවීම හෝ 3 වන ඡේදයේ සඳහන් සථානයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම සිදුකළ හැක. ලංසු ලංසුභාර ගැනීම අවසන් වීමට නියමිත දින සිට දින 77 කාල පරිච්ඡේදයන් සඳහා හෝ ගැනුම්කරු විසින් තීරණය කරනු ලබන ඕනෑම දීර්ඝ කරන කාලයක් සඳහා ලංසු වලංගු භාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම මේ සඳහා පැමිණෙන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී සිදුකරනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**5 වන මහල, සුහුරුපාය. ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**

6. පූර්ව ලංසු රැස්වීම 2023.11.07 වන දින පෙ.ව. 10.00ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 5 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ස්ථානයේදී පවත්වනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**5 වන මහල, "සෙත්සිරිපාය", සුහුරුපාය,**
**ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**